මගේ අංකය 029/03/17
නේවාසික ව්‍යාපාර කාර්යාලය
රාජාංගනය
2019/04/25

ව්‍යාපාර කමිටුවේ සියළුම මහත්ම මහත්මීන් වෙත

<u>2019 අප්‍රේල් මස 25 වන දින ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව</u>

රාජාංගනය නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2019 අප්‍රේල් මස 25 වන දින පෙ.ව.9.30 ට ව්‍යාපාර කමිටු රැස්වීම රාජාංගනය නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලීය රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි.පැමිණ සිටි සියළු දෙනා නේවාසික ව්‍යාපෘති කළමණාකාරතුමන්ගේ පිළිගැනීම සහ ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

<u>සහභාගි වූ නිළධාරීන්</u>

01.එස්.ඩී.එම්.රාජපක්ෂ නේවාසික ව්‍යාපෘති කළමණාකරු රාජාංගනය
02.ඩබ්ලිව්.ජේ.එම්.එල්.හේමාල් වාරිමාර්ග ඉංජිනේරු - වා.දෙ
03.එස්.ඩී.ඩී.සිංහපුර කෘෂිකර්ම උපදේශක -මහඉලුප්පල්ලම
04.පී.එන්.සී.කුලසේන ගොවිජන සංවර්ධන නිලධාරි
05.ඒ.එන්.බංඩාර සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්
06.එස්.එම්.එන්.සුභසිංහ සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්
07.ආර්.පී.අයි.එස්.සිරිවර්ධන සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්
08.කේ.පී.කේ.එස්.පතිරණ සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්
09.ඩබ්ලිව්. එම්.ටී.බී. විජේකෝන් සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්
10.එ.පී.පි.කේ.පි. කරුණාතිලක සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්
11.ඩබ්ලිව්.ටී.එම්.ඒ.තෙන්නකෝන් සංවර්ධන නිළධාරි -ගො.සේ.
12.යු.කේ.ඒ.සී උක්වත්ත ඉංජිනේරු සහකාර -වා.දෙ
13.ඩබ්ලිව්.බී.එන්.එන්.වැලිහිඳ ඉංජිනේරු සහකාර -වා.දෙ
14.ඊ.එම්.එස්.ඒ.ඒකනායක ඉංජිනේරු සහකාර -වා.දෙ
15.එම්.පී.එස්.එස්.පතිරණ ඉංජිනේරු සහකාර -වා.දෙ
16.ජේ.ඒ.එස්.ඩබ්ලිව්.ජයකොඩි ඉංජිනේරු සහකාර -වා.දෙ
17.සී.බී.මුදන්නායක ඉංජිනේරු සහකාර -වා.දෙ
18.එල්.එ.පී.ජයවික්‍රම ඉංජිනේරු සහකාර -වා.දෙ
19.කේ.ඩී.කලන්සූරිය ඉංජිනේරු සහකාර -වා.දෙ
20.ඩී.එම්.ආර්.චතුරංගි ඉංජිනේරු සහකාර -වා.දෙ
21.ජේ.එම්.එස්.එස්. දිල්රුක්ෂි ඉංජිනේරු සහකාර -වා.දෙ
22..ඊ.පී.කේ. දිසානායක තාක්ෂණ සහායක-වා.දෙ
23.එල්.එස්.ඩී. ද සිල්වා තාක්ෂණ සහායක -වා.දෙ.
24.ජී.එම්.ජයරත්න සත්ව සංවර්ධන නිළධාරි
25.ඩබ්ලිව්. ක්‍රිෂාන්ත සංජීව ජලපාලක
26.පී.එන්.සූරසේන ජලපාලක
27.එස්.එච්.එස්.එස්.ජයතිලක ජලපාලක
28.ජේ.ඒ.අයි.පී.ජයසිංහ ජල පාලක

<u>සහභාගි වූ ගොවි නියෝජිතයන්</u>

01.වී.ජී.සරත්සේන ගරු සභාපති රංකෙත
02.හැරිසන් හෙට්ටිආරච්චි ගරු සභාපති ජයමග
03.අයි.පී.සරණපාල උප සභාපති තිස්සපුර
04.බී. ආනන්ද ජයසිංහ ගරු සභාපති කන්ද උඩ

05.ඩී.පී.සමරසිංහ ගරු සභාපති පැරකුම්
06.ආර්.එම්.සී.නවරත්න ගරු සභාපති සමගි
07.ඩී.එල්.සෝමපාල ගරු සභාපති එක්සත් ගැමුණු
08.ආර්.ඩී. ජයවර්ධන ගරු සභාපති කනුපුරණ

09.අයි.කේ.ධර්මතිලකරත්න ගරු සභාපති ඩී.එස්.සේනානායක
10.එස්.සුනිල් ප්‍රේමරත්න ගරු භාණ්ඩාගාරික ජයන්තිපුර
11.එල්.බී.ඉන්ද්‍රදාස ගරු සභාපති පැරකුම්
12.ඩී.එම්.සරත් විජේපාල ගරු සභාපති අරුණළු
13.එච්.එම්.රුවන් උදයංග ගරු සභාපති කෙත්සිරි
14.ආර්.ඩී.ජයසිංහ ගරු සභාපති පුබුදු
15.ගුණතිලක රාජපක්ෂ ගරු සභාපති බී.ඔ.පී. 560 උදාර
16.වයි.ඒ.අනුර කමල්සිරි ගරු ලේකම් ශ්‍රී සාලියරාජ
17.ටී.ජී.සෙනෙවිරත්න ගරු සභාපති පුරසඳ
18.කේ.කේ.ආරියවංශ ගරු භාණ්ඩාගාරික සාලියගම
19.එම්.එම්.එන් සෝමතිලක ගරු සභාපති වීරපුර
20.එම්.පී.සෝමරත්න ගරු සභාපති ශ්‍රී විජය
21.ඩබ්ලිව්.බී.ප්‍රියන්ත ගරු භාණ්ඩාගාරික ශ්‍රී විජය
22.ටී.එම්.බී. සේපාල ගරු සභාපති සුහද
23.එච්.ඩී.එන්.විජේසුරිය ගරු භාණ්ඩාගාරික ප්‍රදීපාලෝක
24.ඩි.ඩී.එස්. රාජපක්ෂ ගරු සභාපති බී.ඔ.පී. 711/2
25.ඩී.අයඩින්ද සිල්වා ගරු සභාපති එකමුතු
26.එච්.එම්.පුංචිබංඩා ගරු සභාපති සාරකෙත
27.ඩබ්ලිව්.ජී.වසන්තලාල් ප්‍රේමසිරි ගරු සභාපති අරුණළු(උස්සාන)
28.ඩී.එම්. පද්ම කුමාර ගරු සභාපති මහසෙන්
29.එස්.උපුල් ශාන්ත ගරු සභාපති ජය ශ්‍රී
30.එච්.ඒ.පී.එස්. ගුණසේකර ගරු සභාපති ලක්බිම(උස්සාන)
31.කේ.ඒ. රුවන් නිශාන්ත ගරු සභාපති තරුණගොවි
32.අයි.ඩී.සේනාරත්න ගරු සභාපති සඳගල
33.පී.ඩී.සරණපාල ගරු ලේකම් රංකෙත (ව.ඉ)

ආයතන සංවර්ධන කටයුතු - එස්.එම්.එන්.සුභසිංහ මයා

| කාරණය | ප්‍රගතිය |
|---|---|
| ගො. සං.නිළවරණ මහ සභා පැවැත්වීම | 01 |
| මහ සභා පැවැත්වීම | 09 |
| මාසික කමිටු රැස්වීම් පැවැත්වීම | 45 |
| මුදල් සාරාංශ ලබා ගැනීම | 49 |
| අභ්‍යන්තර ගිණුම් පරීක්ෂාව | 49 |
| බාහිර ගිණුම් විගණනය | 06 |

අදහස් දැක්වීම - නේවාසික ව්‍යාපාර කළමණාකරු - එස්.ඩී.එම්.රාජපක්ෂ මයා

මේ වන විට රාජාංගනය ව්‍යාපාරයේ සියළු ගොවි සංවිධානවල රාජ්‍ය විගණන කටයුතු ආරම්භ කර තිබිය යුතු බවත් 2018 වර්ෂයට අදාල විගණන කටයුතු මේ වන විටත් අවසන් කර නොමැති ගොවි සංවිධන ඒ සඳහා කඩිනමින් පොත්පත් සකස්කර ගන්නා ලෙසත් පැවසූ එතුමා මහා වාරිමාර්ග ව්‍යාපාර වල සියළු ගොවි සංවිධානවල නිළවරණ කටයුතු ජුනි,ජුලි මාසවල සිදුකලයුතු බැවින් මෙම වර්ෂයට නිළවරණ පැවැත්වීමට නියමිත ගොවි සංවිධාන ඒ සඳහා සුදානම් වියයුතු බවත් පවසා සිටින ලදි.

වාරිමාර්ග කටයුතු -වාරිමාර්ග ඉංජිනේරු - ඩබ්ලිව්.ජේ.එම්.එල්.හේමාල් මයා

ජල ධාරිතාවය
රාජාංගනය ජලාශය අඩි - 31.02
රාජාංගනය ජලාශය අක්කර අඩි -67510
අංගමුව ජලාශය අඩි - 16.05
අංගමුව ජලාශය අක්කර අඩි -8700

යාය 13-18 ජල හිඟතාවයක් පැවතුන බවත් මෙම කන්නයට හෝ එම ප්‍රෙද්ශ වලට ජල පාලක මහතෙකු පත් කරගන්නා ලෙසත් තමන් ඉල්ලා සිටි බවත් එමෙන්ම ගොවි සංවිධානය තුල නිළධාරි මහතුන් ඉතා සහයෝගයෙන් කටයුතු කර කන්නය සාර්ථක කරගත යුතු බවත් පවසා සිටින ලදි.

ගොවි සංවිධාන ගැටළු ඉදිරිපත් කිරීම

| ඉදිරිපත් කල අය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| දකුණු ඉවුර ශ්‍රිවිජය ගොවිසංවිධාන ගරු සභාපති එම්.පී.සෝමරත්න මහතා | අප්‍රේල් 20 වන දින තම ප්‍රෙද්ශයට ජලය ලබා දුන්නද දින 03න් ජලය වසා දැමිම නිසා ගොවීන් අසරණතාවයට පත්ව ඇති බව. | එම ප්‍රෙද්ශයට විශේෂත්වයක් කොට ජලය ලබාදිමට කටයුතු කරන බවත් ඉහල ගොවි සංවිධාන වලින් ඒ සඳහා සහයෝගය ලබාදෙන ලෙසත් ගොවි සංවිධානයතුල ජල කළමණාකරනය කලයුතු බවත් පවසා සිටින ලදි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| දකුණු ඉවුර ප්‍රදිපාලෝක ගොවිසංවිධාන ගරු භාණ්ඩාගාරික එච්.ඩී.එන්.විජේසුරිය මහතා | යාය 12 ගොවි සංවිධානයේ ගොවිමහතුන් හටද තවදුරටත් ජල අවශ්‍යතාවය ඇති බැවින් ජලය ලබාදෙන ලෙස ඉල්ලීම | තමා ක්ෂේත්‍රය පරික්ෂා කිරීම සදහා කිහිපවිටක් එම ප්‍රෙද්ශයට ගියද ගොවින් කුඹුරු වලට බැස නොතිබීම කනගාටුවට කරුණක් බවත් එම සංවිධානයට හොදින් ජලය ලැබුන බවත් ජලය නාස්ති කිරීම නොකළ යුතු බවත් එම්.පී.එස්.එස් පතිරණ මහතා පෙන්වා දෙන ලදි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| තත.ත.තතවම් ඉවුර වීරපුර ගොවිසංවිධාන ගරු සභාපති.එම්.එම්.එන් සෝමතිලක | තම ගොවි සංවිධාන බලප්‍රෙද්ශයේ FC ඇළවල් කිහිපයකටම ජල හිඟතාවයක් පවතින බවත් මේවන විට 60%ක් වපුරා අවසන් බවත් තව දින 03ක් ජලය ලබා දෙන්නේනම් 90%ක් අවසන් කල හැකි බවත් පැවසූ එතුමා පැල ගොයමට දින 07ක් වසා දින 03ක් ජලය ලබාදෙන ලෙසත් ඉල්ලීම | කන්න තීරණය කිරිම සඳහා රැස්වම් පවත්වා ක්‍රමවේදයකට අනුව කන්නය සැලසුම් කර ගොවීන් දැනුවත්කර ඇති බැවින් පසුව එම තීරණ වෙනස් කරන්නේනම් සියළු දේ ඵල රහිත වන බව යු.කේ.ඒ.සී.උක්වත්ත මහතා පෙන්වාදෙන ලදී. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| දකුණු ඉවුර කෙත්සිරි ගොවිසංවිධාන ගරු සභාපති එච්.එම්.රුවන් උදයංග | ජල මුරය ක්‍රියාත්මක කිරිමේදි කැපවීමෙන් කලට වේලාවට කටයුතු කල ගොවිමහතුන්ට සාධාරණයක් විය යුතු බැවින් සම්පුර්ණයෙන් ජලය ලබාදිය යුතු බව ප්‍රකාශකර සිටින ලදි. | - | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| දකුණු ඉවුර රංකෙත ගොවිසංවිධාන ගරු සභාපති වී.ජී.සරත්සේන මහතා | දින හතේ ජලමුරය ක්‍රියාත්මක කිරිමේදි වපුරන ගොවීන්ට හා වපුරා අවසන් කුඹුරු සඳහා ගැටළුවක් වන බැවින් යාය 18 ජලය ලබාදීවෙම්දී තම සංවිධානයේ එක් දොරටුවක් හෝ විවෘත කිරිමට අවසර දෙන ලෙස ඉල්ලීය. | | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| දකුණු ඉවුර පැරකුම් ගොවිසංවිධාන ගරු සභාපති ඩී.පී.සමරසිංහ මහතා | තම ප්‍රෙද්ශයේ මේවන විට 90% වපුරා අවසන් බවත් ඉතිරි 10% සඳහා දින 4 වසා දින 03ක් ජලය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.එමෙන්ම කසළ බැරල් ඉවත් කිරිම සඳහා යම් ක්‍රමවේදයක් සකසාදෙන ලෙස ඉල්ලීම | | වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>නේ.ව්‍ය.කාර් |

| | | | |
|---|---|---|---|
| දකුණු ඉවුර තිස්සපුර ගොවිසංවිධාන ගරු සභාපති අයි.පී.සරණපාල මහතා | ඊ් ලග කන්නයේ ජල ගැටළුවත් සමග රාජාංගනය ව්‍යාපාරයටද කැකුළන් වැනි ක්‍රමයක් සුදුසු බවත් ඒ විට ජලය අපතේ යාම වලක්වාගත හැකි බවත් පැවසීය. | | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| වම් ඉවුර පැරකුම් ගොවිසංවිධාන ගරු සභාපති එල් .බී.ඉන්ද්‍රපාල මහතා | තම ප්‍රෙද්ශයේද 90% වපුරා අවසන් බවත් එම ප්‍රෙද්ශයේ ගොවි සංවිධාන 03 අතර ඇතිවී ඇති ගැටළුව විසඳා ගැනිමට යම් ක්‍රමවේදයක් සකසා දෙන ලෙස ඉල්ලීම. පොහොර වැඩසටහන සාර්ථකව සිදුකිරිම සම්බන්ධව ප්‍රෙද්ශිය නිළධාරිතුමාටද ස්තුතිය පලකර සිටින ලදි, | එක ඩී. ඇලකින් ගොවි සංවිධනෙ 03ට ජලය ලබාදිමේ ගැටළුව හේතුවෙන් ඒකාබද්ධ ජලපාලක කෙනෙකු මෙම ස්ථානයට යෙදවීම සුදුසු බවත් නොඑසේනම් මෙම ගැටළුව දි ගින් දිගටම පැවතිය හැකි බවත් සී.බී. මුදන්නායක මහතා පෙන්වාදෙන ලදි. | |
| දකුණු ඉවුර එකමුතු ගොවිසංවිධාන ගරු සභාපති ඩී.අයඩින්ද සිල්වා මහතා | යාය 18 ප්‍රෙද්ශයට ජලය ලබාදෙන විට තම ප්‍රෙද්ශයටද යම් පමණකින් හෝ ජලය ලබාදෙන ලෙසත් FC08 කෙත් ඇලප්‍රතිසංස්කරණය කරදෙන ලෙසත් ඉල්ලා සිටින ලදි. | | |
| දකුණු ඉවුර ජයමඟ ගොවිසංවිධාන ගරු සභාපති හැරිසන් හෙට්ටිආරච්චි | යාය18 ශ්‍රිවිජය ගොවි සංවිධානය දේශපාලන අරමුණු මත පිහිට වු බවත් එම නිසා ඉදිරි ජල හිඟ කන්න වලදී මෙහි 50% අතිරේක බෝග වගා කිරිම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි. | Fc13 ඇල සඳහා වාරි ජලය ලබාදුන් බවත් ඉන් පහල කොටස සුළු වාරි යටතට අයත් වන බවත් ශ්‍රි විජය ගොවි සංවිධානයේ ගරු සභාපති සෝමරත්න මහතා බවසා සිටින ලදි. | |
| වම් ඉවුර සුහද ගොවිසංවිධාන ගරු සභාපති ටී.එම්.බී. සේපාල | තමන්ගේ සංවිධානයට අයත් අක්කර 631 පමණ පවතින බවත් එයින් අක්කර 360 පමණ වපුරා අවසන් බවත් ප්‍රකාශ කල එතුමා එහි මිරිස් අක්කර 23ක් එළවලු අක්කර 20 පමණද කෙසෙල් අක්කර 02ක් පමණ ඇති බවත් | | |

| | | | |
|---|---|---|---|
| | තමාගේ හාන ලද අක්කර 06 ට අඟල් 6ක පමණ බටයකින් ජලය නොයන බවත් පැවසූ එතුමා ගොවින්ටද යම් යම් ගැටළු ඇති හෙයින් යම් සාධාරණයක් කරනලෙස ඉල්ලා සිටින ලදි. | | |

| | | | |
|---|---|---|---|
| දකුණ ඉවුර ගැමුණු එක්සත්ගොවිසංවිධාන යේ ගරු සභාපති ඩී.එල් සෝමපාල මහතා | FC10 ඇල අළුත් වැඩියා කිරීම නිසා කුඹුරු අක්කර 20ක් පමණ කරදරයකින් තොරව ජලය ලබාගත් බවත් ඒ සඳහා ස්තුති වන්ත වන බවත් පැවසූ ඒතුමා තම සංවිධානයේ වසා දැම්මට නොහැකි දොරවල් කිහිපක් පවතින බවත් ඒවා පිලිබඳව සැලකිලිමත් වන ලෙසත් ඉල්ලා සිටින ලදි. | | වා.මා.දෙ |

අදහස් දැක්වීම- නේවාසික ව්‍යාපාර කළමණාකරු -එස්.ඩී.එම් රාජපක්ෂ මහතා

වසර 19ක් පමණ රාජාංගනය දකුණ ඉවුර ප්‍රෙද්ශයට මහඟු සේවාවක් කළ සත්ව සංවර්ධන උපදේශක ජයරත්න මහතා උසස්වීමක් ලබා අනුරාධපුරයට මාරුවීමක් ලබා ඇති බවත් මෙතෙක් කල මෙහෙයට ස්තුති වන්තවන අතරම එතුමාට සුභාසිංසනය පිරිනමන ලදි. අනතුරුව එතුමාට වචන කිහිපයක් ප්‍රකාශ කිරිමට සලසාදෙන ලදි.

- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ ඉංජිනේරු සහකාර චන්දන මහතා හා එක්සත් ගැමුණු ගොවි සංවිධානයේ ගරු සභාපති ඩී.එල් සෝමපාල මහතා සත්ව සංවර්ධන උපදේශක මහතා කල සේවාව පිළිබඳව ස්තුතිය එලකලහ.

අදහස් දැක්වීම දකුණ ඉවුර සත්ව සංවර්ධන උපදේශක - ජී.එම්.ජයරත්න මහතා

නව පත්විමක් ලබා වසර 19 පෙර තමා රාජාංගනය ව්‍යාපාරයට පැමිණි ආකාරයත් එහිදි සත්ව පාලන සිදු කරන ගොවි මහතුන් හා සම්බන්ධ වී තමන් කුමන අයුරකින් කටයුතු

කලේද යන්න පැවසු එතුමා මූලික අවධියේදී තමන්ගේ උපදේශයන්ගෙන් තම ක්ෂේත්‍රය තුල සිදුවූ වර්ධනය පිළිබඳවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදි.

අදහස් දැක්වීම - ක්ෂේත්‍ර බෝග නිලධාරි - මහඉළුප්පල්ලම - එස්.ඩී.ඩී.සිංහපුර මහතා

අතිරේක ආහාර බෝග එලවළු බෝග වී වැනි බෝග මහ ඉළුප්පල්ලමේ සිදුකරන බවත් සෝයා, තල, උඳු, වැනි බීජ තම ආයතනය විසින් මිලදී ගන්නා බවත් මෙවැනි වැඩසටහනකට ගොවි මහතුන් සම්බන්ධ වීමට කැමතිනම් තම ආයතනය සමඟ එක්වන ලෙසත් ඉල්ලා සිටින ලදි. එමෙන්ම නිසි ජල කළමණාකරනය සඳහා අඩු කාල පරිච්ඡේදයක්න් අස්වැන්න ලබාගත හැකි වී ප්‍රභේද කීපයක් ද හඳුන්වාදුන් අතර එලවළු බීජ නිෂ්පාදනය ගොවිමහතුන්ට එක්වන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

අදහස් දැක්වීම - ගොවිජනසේවා කටයුතු- දකුණඉවුර ගොවිජනසංවර්ධන ප්‍රාදේශීය නිළධාරි - පී.එන්.සී.කුලසේන මහත්මිය

පොහොර වැඩසටහන සම්බන්ධව ගොවි මහතුන් පැසසුමට ලක්කල යුතු බව පැවසු එතුමිය මුදල් එකතුකර නොමැති ගොවි සංවිධාන තවදුරටත් බලන ලෙස ඉල්ලීය. ණය ව්‍යාපෘතිය සිදුකරමින් පවතින බවත් අයදුම් පත්‍ර අප්‍රේල් 30ට කලින් ලබාදිය යුතු බවත් පෙන්වාදෙන ලදි. ගැටළු ඇත්නම් පෞද්ගලික දුරකථන අංකයට දැනුම් දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

ස්තුති කථාව

ගැමුණු එක්සත් ගොවි සංවිධානයේ ගරු සභාපති ඩී.එල්.සෝමපාල මහතා විසින් ව්‍යාපාර කමිටු රැස්වීමට සහභාගි වී සහයෝගය ලබාදුන් රාජ්‍ය නිළධාරින් ඇතුළු සියළු ගොවි සංවිධාන නිලධාරින්ට තුති පුද කරන ලදී

එස්.ඩී.එම්. රාජපක්ෂ
නේවාසික ව්‍යාපාර කළමණාකරු
නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලය
රාජාංගනය

පිටපත් -
01.අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය දැ.ගැ.පි.
02.දිස්ත්‍රික ලේකම් අනුරාධපුරය.කුරුණෑගල පුත්තලම දැ.ගැ.පි.
03.වාරිමාර්ග අධ්‍යක්ෂ අනුරාධපුරය දැ.ගැ.පි.
04. නියෝජ්‍ය කෘෂිකර්ම.අධ්‍යක්ෂ අන්තර් පළාත් දැ.ගැ.පි.
05. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් දැ.ගැ.පි.
06.ප්‍රාදේශිය ලේකම් රාජාංගනය .ගිරිබාව. පුත්තලම දැ.ගැ.පි.
07.අධ්‍යක්ෂ වත්කම් කළමනාකරණය වා/දෙ දැ.ගැ.පි.
08. වාරිමාර්ග ඉංජිනේරු රාජාංගනය දැ.ගැ.පි.
09. ගොවිජන සංවර්ධන නිලධාරි වම් ඉවුර. දකුණ ඉවුර සාලියවැව දැ.ගැ.පි.
10. මූලස්ථාන කෘෂිකර්ම උපදේශක වම් ඉවුර දකුණ ඉවු දැ.ගැ.පි.
11. කෘෂි රක්ෂණ මණ්ඩලය තඹුත්තේගම /මහව දැ.ගැ.පි.
12. ගොනුවට